# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1343/31 – 2004 ජූනි 04 වැනි සිකුරාදා – 2004.06.04

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1)(අ) වැනි ව්‍යවස්ථාව යටතේ මාවෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් මවිසින් 2004.04.28 වැනි දින අංක 1338/9 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලදුව අංක 1340/13 හා 2004.05.15 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය මගින් සංශෝධිත නිවේදනය, මෙම නිවේදනයේ දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ලෙසින් තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග,
ජනාධිපතිනි.

2004 ජූනි මස 04 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

(අ) "මුදල් අමාත්‍ය" යන ශීර්ෂය යටතේ I වැනි තීරුවේ අගට "ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව" යන වචන ඇතුළත් කිරීමෙන් සහ

එම ශීර්ෂය යටතේ II වැනි තීරුවේ අගට පහත සඳහන් වචන ඇතුළත් කිරීමෙන්

"ජාතික සංවර්ධන ප්‍රතිපත්තිය පදනම් කොටගත් මධ්‍ය කාලීන සාර්ව ආර්ථික ප්‍රතිපත්ති රාමුවක් හා අංශයීය සැලසුම් සම්පාදනය"

"ආර්ථික සංවර්ධනය සඳහා වූ ජාතික සභාවට ශිල්පීය සහාය"

"ආර්ථික අංශයන් සඳහා වාර්ෂික සැලසුම් සකස් කිරීම"

"අදාළ අමාත්‍යාංශ සමග සම්බන්ධවී අංශයීය වැඩ සටහන් සම්පාදනය කිරීම"

"අංශයීය ප්‍රතිපත්ති හා වැඩසටහන් මෙහෙයවීම හා සමාලෝචනය කිරීම"

1A-G 004288 - 960 (2004/06)

(ආ) "වැවිලි කර්මාන්ත අමාත්‍ය" යන ශීර්ෂය යටතේ I වැනි තීරුවේ අගට "සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව" යන වචන ඇතුළත් කිරීමෙන්

(ඇ) "කාන්තා අභිවෘද්ධි සහ සමාජ සුභ සාධන අමාත්‍ය" යන ශීර්ෂය යටතේ I වැනි තීරුවේ අගට "ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය" යන වචන ඇතුළත් කිරීමෙන්

සහ

එම ශීර්ෂය යටතේ II වැනි තීරුවේ අගට පහත සඳහන් වචන ඇතුළත් කිරීමෙන්

"ගිනි ගැනීම්, වර්ෂාව, කුණාටු හෝ වෙනත් විශේෂ හේතු නිසා වාසස්ථාන, වෘත්තීය උපකරණ හෝ ධීවර යාත්‍රා ආදියට සිදුවන හානි සඳහා සහන සැලසීම"

"ගංවතුර, නියඟ, වසංගත රෝග හෝ වෙනත් විශේෂ හේතුන් නිසා ඇති වන ආපදා සඳහා සහනාධාරදීම සහ එම ආපදාවන්ට ගොදුරුවූවන් පුනරුත්ථාපනය කිරීම හා නැවත පදිංචි කරවීම"

06-576

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.